**ශීර්ෂය 268 - කිලිනොච්චි දිස්ත්‍රික් ලේකම් කාර්යාලය/කච්චේරිය**
**විගණකාධිපති වාර්තාව - 2013 වර්ෂය**

---

## 1.1 දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ ප්‍රධාන කාර්යයන්

(i) පහත දැක්වෙන සේවා සැපයීම මඟින් දිස්ත්‍රික්කයේ හා ප්‍රාදේශීය පරිපාලනය සාමාන්‍ය මට්ටම දක්වා ගෙනඒම

- ජාතික හැඳුනුම්පත් සම්බන්ධ සේවාවන්
- චරිත සහතික හා පදිංචිය සනාථ කිරීමේ සහතික නිකුත් කිරීම
- කාර්ය සැලැසුම් සම්බන්ධ ක්‍රියාකාරකම්
- ආගමික හා සදාචාර වර්ධන අමාත්‍යාංශයේ සහාය ඇතිව ආගමික සිද්ධස්ථාන ප්‍රතිසංස්කරණය සඳහා පහසුකම් සැපයීම

(ii) වත්කම් කාර්යක්ෂමව හා ඵලදායීව උපයෝජනය

(iii) විශ්‍රාම වැටුප් ගෙවීම් කටයුතු කාර්යක්ෂම කිරීම

(iv) මහින්ද චින්තන, විමධ්‍යගත අයවැය හා වෙනත් වැඩසටහන් යටතේ කිලිනොච්චි දිස්ත්‍රික්කයේ සංවර්ධන කාර්යයන් සම්බන්ධීකරණය කිරීම

(v) ගොවීන්ගෙන් වී මිලදී ගැනීම සඳහා වී අත්තිකාරම් ගෙවීම

(vi) දිස්ත්‍රික් කළමනාකරණ ක්‍රියාවලීන්

(vii) දිස්ත්‍රික් පුනරුත්ථාපන හා ප්‍රතිසංස්කරණ කාර්යයන්

(viii) අවතැන්වූ පුද්ගලයන් සඳහා සහ නැවත පදිංචිකිරීමේ වැඩසටහනට අදාල ක්‍රියාකාරකම් සම්බන්ධයෙන් ජනතාවට සේවා සැපයීම

(ix) අභ්‍යන්තරිකව අවතැන්වූ පුද්ගලයින් සඳහා යටිතල පහසුකම් ඉදිකිරීම හා ඒවා නඩත්තු කිරීම

(x) උප්පැන්න, මරණ, විවාහ සහතික නිකුත් කිරීම හා ඉඩම් ලියාපදිංචි කිරීමේ කටයුතු

(xi) දිවි නැගුම වැඩසටහන ක්‍රියාත්මක කිරීම

## 1.2 දිස්ත්‍රික් ලේකම් කාර්යාලය යටතේ ඇති ප්‍රාදේශීය ලේකම් කාර්යාල

(අ) පූනාකරි

(ආ) කරච්චි

(ඇ) පච්චිලයි පල්ලි

(ඈ) කන්දවලෙයි

**1.3 විගණන විෂය පථය**

---

කිලිනොච්චි දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය වාර්තා, සැසඳුම් ප්‍රකාශන, පොත්පත්, ලේඛන හා අනෙකුත් වාර්තා අන්තර්ගත වූ විසර්ජන ගිණුම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන යටතේ විගණනය කරන ලදී. සමාලෝචිත වර්ෂය සඳහා වූ කළමනාකරණ විගණන වාර්තාව 2014 නොවැම්බර් 10 දින දිස්ත්‍රික් ලේකම්වරයා වෙත නිකුත් කරන ලදී. ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ විගණන නිරීක්ෂණ, අදහස් දැක්වීම් සහ සොයා ගැනීම්, විගණනය සඳහා ඉදිරිපත් කරන ලද ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ සමාලෝචනය සහ ගනුදෙනුවල නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂා කිරීම් මත පදනම් වී ඇත. එම සමාලෝචනය හා පරීක්ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය, මට ලැබී ඇති කාර්ය මණ්ඩලය, අනෙකුත් සම්පත් හා කාලවේලා යන සීමාවන් ඇතුළත හැකිතාක් පුළුල් විගණනයක් කළ හැකිවන පරිදි පිළියෙල කරන ලද්දකි.

**1.4 ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම**

---

විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148,149,150 හා 152 ව්‍යවස්ථාවන්, වෙනත් ව්‍යවස්ථාපිත විධිවිධානයන්, රාජ්‍ය මූල්‍ය හා පරිපාලන රෙගුලාසිවලට අනුකූලව පවත්වා ගෙනයාම, පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ. වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන අභ්‍යන්තර පාලනයන් සැලැසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම සහ පවත්වා ගෙන යාමත් මෙම වගකීමට ඇතුළත් වේ.

**1.5 විගණන නිරීක්ෂණය**

---

2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය වාර්තා හා පොත් අනුව දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන මෙහි (අ) සිට (ඇ) දක්වා වූ පොදු නිරීක්ෂණ සහ පහත 1.6 සිට 1.13 දක්වා ඡේදවල සඳහන් ප්‍රධාන විගණන සොයා ගැනීම් හැර සතුටුදායක ලෙස පිළියෙල කර ඇති බව නිරීක්ෂණය විය.

**(අ)** **ගිණුම් ඉදිරිපත් කිරීම**

අවස්ථා 09කදි රු.814,750ක් වූ මූලධන වියදම් සාවද්‍යව වර්ගීකරණය කර විවිධ වැය විෂයයන් යටතේ පුනරාවර්තන වියදම් ලෙස ගිණුම්ගත කර තිබුණි.

**(ආ)** **විසර්ජන ගිණුම්**

(i) **මුළු ප්‍රතිපාදනය හා වියදම**

දිස්ත්‍රික් ලේකම් කාර්යාලය සඳහා සළසා තිබුණු මුළු ශුද්ධ ප්‍රතිපාදනය රු.201,587,867ක්වූ අතර, සමාලෝචිත වර්ෂය අවසාන වනවිට ඉන් රු.197,456,286 ක් උපයෝජනය කර තිබුණි. ඒ අනුව ශුද්ධ ප්‍රතිපාදනයෙන් රු.4,131,581ක් හෙවත් සියයට 2.05ක් ඉතිරි වී තිබුණි. විස්තර පහත දැක්වේ.

| **වියදම** | **2013 දෙසැම්බර් 31 දිනට** | | | **ඉතිරිය ශුද්ධ ප්‍රතිපාදනයේ ප්‍රතිශතයක් ලෙස** |
|---|---|---|---|---|
| | **ශුද්ධ ප්‍රතිපාදනය** | **උපයෝජනය** | **ඉතිරිය** | |
| | **රු.** | **රු.** | **රු.** | |
| පුනරාවර්තන | 151,387,867 | 148,203,239 | 3,184,628 | 2.1 |
| මූලධන | 50,200,000 | 49,253,047 | 946,953 | 1.89 |
| එකතුව | **201,587,867** | **197,456,286** | **4,131,581** | **2.05** |

**(ii)** **අයවැය විචලනය**

- වැය විෂයයන් 12 ක් සඳහා වෙන් කර තිබූ ප්‍රතිපාදන රු.6,860,000 කින් අඩු කර තිබූ අතර වැය විෂයයන් 11 සඳහා වූ ප්‍රතිපාදන එම ප්‍රමාණයෙන් වැඩිකර තිබුණි.

- වැය විෂයයන් අතර ප්‍රතිපාදන මාරුවීම් සම්බන්ධයෙන් ප්‍රමාණවත් හේතු ඉදිරිපත් නොවූ අතර ප්‍රතිපාදන ඉතිරිවීම් සඳහා වූ හේතු ද ප්‍රමාණවත් නොවිය.

**(iii)** **මුල්‍ය ප්‍රතිපාදන නොමැතිව වියදම් දැරීම**

**------------------------------------------**

මුල්‍ය ප්‍රතිපාදන වෙන්කිරීමකින් තොරව රු.148,500 ක් වු වියදම් වැරදි සහගත ලෙස දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ වැය විෂය අංක 268 – 1- 1-0 -1405 යටතේ ගිණුම් ගත කර තිබුණි. (2013 දෙසැම්බර් 30 දිනැති 2358 දරන වවුචරය) සංඛ්‍යාලේඛණ අත්පොත් මුද්‍රණය සඳහා 2013 වර්ෂයේදී උතුරු පළාත් ප්‍රධාන ලේකම්වරයාගෙන් රු.200,000 ක් ලැබී තිබූ නමුත් එම මුදල් අදාල කටයුත්ත සඳහා උපයෝජනය කර නොතිබුණි.

**(iv)** **වෙනත් අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු විසින් ලබා දුන් ප්‍රතිපාදන උපයෝජනය**

-----------------------------------------------------------------------------------------------

විවිධ කාර්යයන් සඳහා වෙනත් අමාත්‍යාංශ 13 ක් හා දෙපාර්තමේන්තු 11ක් විසින් පිළිවෙලින් රු. 161,468,097ක් හා රු.188,085,936ක් වශයෙන් එකතුව රු.349,553,033 ක් වු ප්‍රතිපාදන දිස්ත්‍රික් ලේකම් කාර්යාලය වෙත ලබාදි තිබුණු අතර, එම ප්‍රතිපාදනවලින් පිළිවෙලින් රු.148,025,333 ක් හා රු.178,026,072 ක් වශයෙන් එකතුව රු.326,051,405 ක් උපයෝජනය කර තිබුණි. ඒ අනුව සමාලෝචිත වර්ෂය අවසාන වන විට පිළිවෙලින් රු.10,058,864 ක් හා රු.13,442,764 ක් වශයෙන් එකතුව රු.23,501,628ක ප්‍රතිපාදන ඉතිරි වි තිබුණි. එම ඉතිරිවීම් ලබාදී තිබුණු ප්‍රතිපාදනයෙන් පිළිවෙලින් සියයට 01ත් සියයට 100ත් අතර පරාසයක ප්‍රමාණයක් වී තිබුණි.

- **පහත සඳහන් අධිවැය විගණනයේදි නිරීක්ෂණය විය.**

| **ආයතනය** | **ශීර්ෂය** | **සළසා තිබුණු ප්‍රතිපාදනය** | **කළ වියදම** | **ඉක්මවීම** |
|---|---|---|---|---|
| --------- | --------- | ---------------- | ------------- | ----------- |
| | | රු. | රු. | රු. |
| ළමා හා කාන්තා කටයුතු අමාත්‍යාංශය | 120 | 13,342,572 | 13,473,221 | 130,649 |
| ඵලදායිතා හා ප්‍රවර්ධන අමාත්‍යාංශය | 181 | - | 198,864 | 198,864 |

- නැවුම් කිරි බෙදාහැරීම පිළිබඳ කිසිඳු මැදිහත්වීමක් නොමැතිව සේවක සුභ සාධක සංගමයට රු.222,644ක් වූ බෙදාහැරීමේ ගාස්තු කරච්චි ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් ගෙවා තිබුණි. මෙම ගෙවීම ළමා සංවර්ධන හා

කාන්තා කටයුතු අමාත්‍යාංශය විසින් නිකුත් කරන ලද 2012 ජනවාරි 16 දිනැති අංක 2012/1 දරන චක්‍රලේඛයේ 4.3 වගන්තියට පටහැනිව සිදුකර තිබුණි.

➢ **මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව**

(i) මෝටර් රථ වාහන අංශයේ වාහන අංක තහඩු 546 ක් ඒවායේ අයිතිකරුවන්ට නිකුත් කිරීමකින් තොරව ගොඩ ගසා තිබුණි.

(ii) තාවකාලික රියදුරු බලපත්‍ර 4000 ක් පමණ අදාළ අයදුම්කරුවන්ට නිකුත් නොකර රියදුරු පුහුණු පාසල්වලට සාවද්‍ය ලෙස නිකුත් කර තිබුණි.

➢ **ජන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව**

කුලී පදනම මත වාහන සැපයූ පුද්ගලයෙකුට රු.42,570 ක මුදලක් වැඩියෙන් ගෙවා ඇති බව විගණනයේදී නිරීක්ෂණය විය. විස්තර පහත දැක්වේ.

| සත්‍ය ධාවන දුර | ගිවිසුම අනුව කිලෝමීටරයට ගාස්තු ප්‍රමාණය | ගෙවිය යුතු මුදල | ගෙවන ලද මුදල | වැඩියෙන් ගෙවූ මුදල |
|---|---|---|---|---|
| කි.මී | රු. | රු. | රු. | රු |
| 2,968 | 41.25 | 122,430 | 165,000 | 42,570 |

(ඇ) **රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම**

**පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන්**

විෂය අංක 26801 දරන රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම වෙනුවෙන් පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන් හා තථ්‍ය අගයන් පහත දැක්වේ.

| වියදම | | ලැබීම් | | හර ශේෂය | |
|---|---|---|---|---|---|
| උපරිම සීමාව | තථ්‍ය | අවම සීමාව | තථ්‍ය | උපරිම සීමාව | තථ්‍ය |
| රු. | රු. | රු. | රු. | රු. | රු. |
| 16,000,000 | 8,225,326 | 6,000,000 | 9,646,302 | 57,000,000 | 40,905,866 |

(i) රජයේ නිලධාරින්ට අත්තිකාරම් ගිණුම් පිළිබඳ 2013 දෙසැම්බර් 31 දිනට සැසඳුම් ප්‍රකාශය ප්‍රකාරව එදිනට අයවිම් හිඟහිට තිබුණු ශේෂවල එකතුව රු.40,905,867ක් වු අතර, එම හිඟහිටි ශේෂ අයකර ගැනීමේ පසු විපරම් කටයුතු දුර්වල මට්ටමක පැවතුණි.

(ii) 2011 ඔක්තෝබර් 20 දිනැති අංක බීඩී/ජීපීඑස්/ඒඒ/2001/එස් දරන භාණ්ඩාගාර චක්‍රලේඛයට අනුකූල වීමෙන් තොරව දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් රු.3,064,000ක් වූ වර්ෂ එක/වර්ෂ දෙක ණය ලබාදී තිබුණි.

(iii) සමාලෝචිත වර්ෂය තුළදී සේවය හැර ගිය නිලධාරීන් හතර දෙනෙකුගෙන් අයවිය යුතු රු. 699,195ක ණය ශේෂ අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(iv) නිලධාරීන් 5 දෙනෙකුගේ හිඟහිටි ණය සහ අත්තිකාරම් ශේෂය රු.760,135 ක් වූ අතර එම හිඟහිටි ශේෂ අයකර ගැනීමේ පසුවිපරම් කටයුතු දුර්වල තත්ත්වයක පැවතුණි.

**(ඈ) පොදු තැන්පත් ගිණුම**

2013 දෙසැම්බර් 31 දිනට දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ පොදු තැන්පත් ගිණුමේ ශේෂය රු.16,373,013ක් විය. විස්තර පහත දැක්වේ.

| ගිණුම් අංකය | 2013 දෙසැම්බර් 31 දිනට ශේෂය |
|---|---|
| | රු. |
| 6003/0000/00/0014/0000/000 | 16,373,013 |

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) ආයතන 04කට අදාලව එකතුව රු.5,847,300ක් වූ වී මිලදී ගැනීමේ අත්තිකාරම් වර්ෂයකට වැඩි කාලයක සිට හිඟහිටව පැවතුණි.

(ii) තාවකාලික මාර්ග බලපත්‍ර නිකුත් කිරීම තුළින් රැස්කර ගන්නා ලද රු.5,042,410 ක් වූ මුදල් ප්‍රවාහන අධිකාරියට ප්‍රේෂණය කිරීමකින් තොරව පොදු තැන්පත් ගිණුමේ රඳවා තබා තිබුණි.

## 1.6 ගිණුම් කටයුතුභාවය හා යහපාලනය

--------------------------------------

### 1.6.1 වාර්ෂික ක්‍රියාකාරි සැලැස්ම

------------------------------

2010 මාර්තු 10 දිනැති අංක පීඑෆ්/ආර්/2/2/3/5/(4) දරන රාජ්‍ය මුදල් අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ ලිපියේ 1.4.1 ඡේදය ප්‍රකාරව 2010 වර්ෂය සහ ඉන් ඉදිරියට වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මක් පිළියෙල කළයුතු වුවත් දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් සමාලෝචිත වර්ෂය වෙනුවෙන් වූ ක්‍රියාකාරී සැලැස්ම 2013 දෙසැම්බර් 31 දින වන විටත් පිළියෙල කර නොතිබුණි.

### 1.6.2 වාර්ෂික කාර්යසාධන වාර්තාව

--------------------------------

ඉහත 1.6.1 ඡේදයේ සඳහන් රාජ්‍ය මුදල් අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ ලිපිය සහ 2002 සැප්තැම්බර් 12 සහ 2004 පෙබරවාරි 20 දිනැති අංක 402 හා 402 (1) දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛ ප්‍රකාරව දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් වාර්ෂික කාර්යසාධන වාර්තාව පිළියෙල කර මුදල් වර්ෂය අවසාන වී දින 150කට ප්‍රථම විගණකාධිපතිට පිටපතක් සහිතව පාර්ලිමේන්තුවේ සභාගත කළයුතු වූවත් සමාලෝචිත වර්ෂයට අදාල කාර්යසාධන වාර්තාව 2014 සැප්තැම්බර් 30 දින වන විටත් පාර්ලිමේන්තුවේ සභාගත කර නොතිබුණි.

### 1.6.3 අභ්‍යන්තර විගණනය

-------------------------

අභ්‍යන්තර විගණන ඒකකය සඳහා ප්‍රධාන අභ්‍යන්තර විගණකවරයෙකු පත් නොකිරීම නිසා ප්‍රමාණවත් අභ්‍යන්තර විගණනයක් සමාලෝචිත වර්ෂයේදි සිදු කර නොතිබුණි.

**1.6.4 විගණන හා කළමනාකරණ කමිටුව ක්‍රියාත්මක කිරීම**

2000 ජූනි 12 දිනැති අංක අයිඒඅයි/2000/01 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය ප්‍රකාරව විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් හතරක් පැවැත්විය යුතු වුවත් සමාලෝචිත වර්ෂයේ දී දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් රැස්වීම් තුනක් පමණක් පවත්වා තිබුණි.

**1.7 වත්කම් කළමනාකරණය**

(අ) නිෂ්කාර්ය හා ඌන උපයෝජිත වත්කම්

පහත වර්ග කර ඇති පරිදි සමහර වත්කම් නිෂ්ක්‍රීයව හෝ ඌන උපයෝජිතව පැවති බව නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය විය.

| | වත්කම් වර්ගය | ඒකක ගණන | නිෂ්ක්‍රීය හෝ ඌන උපයෝජිතව පැවති කාලය |
|---|---|---|---|
| **(i)** | මෝටර් වාහන | 02 | වර්ෂ 2 සිට 4 දක්වා |
| **(ii)** | වෙනත් වත්කම් | 263 | වර්ෂ 2 |

(ආ) වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ

මුදල් රෙගුලාසි 756 හා 2009 දෙසැම්බර් 09 දිනැති අංක 441 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාරව දිස්ත්‍රික් ලේකම් කාර්යාලය හා ප්‍රාදේශීය ලේකම් කාර්යාල විසින් වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ සිදුකළ යුතු වුවද, ග්‍රාම නිලධාරී කාර්යාල 95ක් සඳහා 2013 වර්ෂය සඳහා භාණ්ඩ සමීක්ෂණ පවත්වා නොතිබුණි.

(ඇ) පුහුණු කටයුතු සඳහා ගොඩනැගිලි භාවිතයට නොගැනීම

කන්දවලායි හි පුහුණු කිරිමේ මධ්‍යස්ථානයක් ඉදිකිරීම සඳහා රු.7,322,624 ක මුදලක් වැයකර තිබුණි. කෙසේ වුවද, අදාල අරමුණ සඳහා ගොඩනැගිල්ල භාවිතා නොකර කන්දවලායි ප්‍රාදේශිය ලේකම් කාර්යාලයේ සැලසුම් අංශයේ භාවිතයට ගෙන තිබුණි.

1.8 **අනුකූල නොවීම්**

**-------------------**

**නීතී, රීති හා රෙගුලාසි යනාදියට අනුකූල නොවීම**

---------------------------------------------------------

නියැදි විගණන පරීක්ෂණවලදි නිරීක්ෂණය වු නීතී, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවු අවස්ථා පහත විග්‍රහ කර දැක්වේ.

| **නීතී,රීති සහ රෙගුලාසිවලට යොමුව** | **වටිනාකම** | **අනුකූල නොවීම** |
|---|---|---|
| **----------------------------------** | **-------------** | **--------------------** |
| | **රු.** | |
| (අ) **භාණ්ඩාගාර චක්‍රලේඛ** | - | |
| **----------------------** | | |
| (i)1999 අප්‍රේල් 09 දිනැති අංක 1/99 දරන චක්‍රලේඛය | - | මුදල් සහ ගබඩා කටයුතුවල නියැලෙන නිලධාරීන්ගෙන් ආරක්ෂක ඇප ලබාගෙන නොතිබුණි. |
| (ii)2002 නොවැම්බර් 28 දිනැති අංක අයිඒඅයි/2002/02 දරන චක්‍රලේඛය | - | පරිගණක, පරිගණක උපාංග හා මෘදුකාංග සඳහා වන වත්කම් ලේඛනය පවත්වා නොතිබුණි. |
| (ආ) 1990 ඔක්තෝබර් 10 දිනැති අංක 41/90 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය | - | දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ සහ ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල වාහන 17ක ඉන්ධන පරිභෝජනය පිළිබඳ පරීක්ෂාවක් සිදුකර නොතිබුණු අතර ලොග් සටහන්ද තබා නොතිබුණි. |
| (ඇ) රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය | | |
| -------------------------------- | | |
| (i)2.14.1 මාර්ගෝපදේශය | 1,200,000 | (i) කාන්තා හා ළමා කාර්යාංශයට කාර්යාල උපකරණ මිලදී ගැනීම වෙනුවෙන් ලියාපදිංචි සැපයුම්කරුවන්ගෙන් මිල ගණන් කැඳවා නොතිබුණි.<br>(ii) කාන්තා හා ළමා කාර්යාංශයේ කාර්යාල උපකරණ මිලදී ගැනීමේදී ලියාපදිංචි |

| | | | |
|---|---|---|---|
| | | | සැපයුම්කරුවන් 05ක් හෝ ඊට වැඩි ගණනකගෙන් මුද්‍රා තබන ලද මිල ගණන් කැඳවා නොතිබුණි. |
| (ii)3.12 මාර්ගෝපදේශය | | - | ලංසුකරුවන්ගේ තාක්ෂණික, කළමනාකාරිත්ව සහ මූල්‍ය හැකියාව මෙන්ම ඔවුන් විසින් කළින් ඉටුකර ඇති කොන්ත්‍රාත්තු සහ නෛතික පසුබිම මත පූර්ව සුදුසුකම් පරීක්ෂාව මුළුමනින්ම පදනම් විය යුතුය. කෙසේ වුවද, ප්‍රසම්පාදනයේදී මෙම අවශ්‍යතා සැලකිල්ලට ගෙන නොතිබුණි. |
| (iii)3.4.2 මාර්ගෝපදේශය | | - | මිල ගණන් ඉදිරිපත් කිරීමේදි සැපයුම්කරු විසින් ආවරණ සහතික (Warranties) පිළිබඳ විස්තර හා එම කාඩ්පත් ද ඉදිරිපත් කිරීම අවශ්‍ය වේ. එසේ වුවත් දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් ඒවා විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. |
| (iv)3.9.1 මාර්ගෝපදේශය | | 1,333,060 | දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් අනුමත නොකරන ලද සමිති වෙත රු.1,333,060 ක කොන්ත්‍රාත්තු 05 ක් පිරිනමා තිබුණි. |
| (ඇ) | 2009 අංක 08 දරන මෝටර් රථ (සංශෝධිත) පනත<br>---------------------------------<br>25 (ආ) ඡේදය | - | ලිඛිත විභාගය සඳහා පෙනී සිටිය නොහැකි අධ්‍යාපනය නොලද පුද්ගලයින් සඳහා වාචික පරීක්ෂණය පැවැත්වීමට ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. |

**1.9 බැංකු ගිණුම් මෙහෙයවීමේ අඩුපාඩු**

**-------------------------------------**

ගැලැපුම් කළ යුතු ශේෂ

-----------------------------

දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් 2013 දෙසැම්බර් 31 දිනට පිළියෙළ කර තිබූ බැංකු සැසඳුම් ප්‍රකාශයේ දැක්වුණු ගැලපුම් පිළිබඳ විග්‍රහයේදි අනාවරණය වූ තොරතුරු පහත දැක්වේ.

| ගැලපුම් පිළිබඳ විස්තර | | කාල විශ්ලේෂණය | |
|---|---|---|---|
| | | මාස 6 ට වැඩි වර්ෂ 01ට වැඩි | එකතුව |
| | | රු. | රු. |
| (i) | නිකුත් කළ නමුත් ගෙවීම සඳහා ඉදිරිපත් නොකළ චෙක්පත් | 17,675 | 17,675 |
| (ii) | හඳුනා නොගත් බැරකිරිම් | 735,670 | 735,670 |

## 1.10 වංචා සහගත ලෙස ගෙවන ලද එකතු කළ අගය මත බදු මුදල්

දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් එකතු කළ අගය මත බදු ලියාපදිංචි අංක, Tax ඉන්වොයිසි යනාදී පරීක්ෂා කිරීමකින් තොරව සිවිල් වැඩ සඳහා ගෙවීම් කිරීමේදි එකතු කළ අගය මත බදු ගෙවීම් 4 ක එකතුව වූ රු.470,668ක් කොන්ත්‍රාත්කරුවන්ට ගෙවා තිබුණි. මේ සම්බන්ධයෙන් වූ ගෙවීම් වංචා සහගත ඒවා බව දැක්විය හැක.

## 1.11 අනාර්ථික ගනුදෙනු

දිස්ත්‍රික්කය තුළ ඇති දෙපාර්තමේන්තු අතර බෙදාහැරීම සඳහා පොත් 200 ක් ප්‍රමාණවත් වී තිබුණත් ඒ සඳහා පොත් 300ක් මුද්‍රණය කර තිබුණි. 2014 අප්‍රේල් 21 දින වන විට ඉන් පොත් 190 ක් පමණක් බෙදාහැර තිබුණි. මේ අනුව, රු.49,500 ක් වූ වියදම නිෂ්ඵල වියදමක් විය.

## 1.12 පාඩු හා හානි

ලී බඩු, කාර්යාල උපකරණ, යන්ත්‍රෝපකරණ, ගොඩනැගිලි සැකැසුම් හා වෙනත් අයිතමයන්ට වූ රු.72,963,466ක් වූ හානි වීම් විගණනයේදි නිරීක්ෂණය විය. මේ සම්බන්ධයෙන් කාර්යාලය කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි.

## 1.13 මානව සම්පත් කළමනාකරණය

**අනුමත සේවක සංඛ්‍යා හා තථ්‍ය සේවක සංඛ්‍යාව**

2013 දෙසැම්බර් 31 දිනට වූ සේවක සංඛ්‍යාව පිළිබඳ තත්ත්වය පහත පරිදි විය.

| | සේවක වර්ගය | අනුමත සේවක සංඛ්‍යාව | තථ්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව |
|---|---|---|---|---|
| (i) | ජ්‍යෙෂ්ඨ මට්ටම | 18 | 15 | 03 |
| (ii) | තෘතියික මට්ටම | 14 | 01 | 13 |
| (iii) | ද්විතියික මට්ටම | 316 | 163 | 153 |
| (iv) | ප්‍රාථමික මට්ටම | 100 | 48 | 52 |
| | | 448 | 227 | 221 |

දිස්ත්‍රික් ලේකම් කාර්යාලය සහ ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල වූ පුරප්පාඩු 221 ක් පිරවීමට 2013 දෙසැම්බර් 31 වන විටත් කටයුතු කර නොතිබුණි.